# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1787/37 – 2012 දෙසැම්බර් 07 වැනි සිකුරාදා – 2012.12.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: හාප/සං/2/ඉ.අ./82.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4/3/3/2011/ඩබ්එස්/36.

මහනුවර හා තදාසන්න ජල සම්පාදන ව්‍යාපෘතියේ කටුගස්තොට ජල පවිත්‍රාගාර සංකීර්ණයේ වැඩි දියුණු කිරීම සඳහා අතිරේක ඉඩම් කොටස් දෙකක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ, කොණ්ඩදෙනිය ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් මැන පිළියෙල කරන ලද අංක මු.පි.මහ/5398 දරන මූලික පිඹුරේ දැක්වෙන හෙක්. 0.0420 ක් පමණ වූ ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 31**
ඉඩමේ නම: දින්ගිරියාදෙනිය; හිමිකම් කියන අය: වලල රජමහා විහාරය; ප්‍රමාණය: හෙක්. 0.0420.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 පෙබරවාරි මස 13 වැනි දින පූ. භා. 10.00 ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 පෙබරවාරි මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ආර්. එම්. පී. එස්. බී. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2012 නොවැම්බර් මස 19 වැනි දින,
නුගවෙල, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 – 618

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 95/ඩබ්එස්/325.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මහනුවර දිස්ත්‍රික්කයේ, හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගංඅට පළාත සුළු කොට්ඨාසයේ, වැලිවිට ඉහළගම ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 164 අතිරේක 7 හා 2012.12.12 දින දරන අවසාන ගම් පිඹුරේ කැබලි අංක 817 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0379 ක් වූ පින්හේන නමැති ඉඩමට මායිම්:

ඉඩමේ නම: පින්හේන; හිමිකම් කියන අය: වල්පොළ සද්ධානන්ද හිමි, මිනිගමුව පුරාණ විහාරය, මිනිගමුව, ගලගෙදර; ප්‍රමාණය: හෙක්. 0.0379.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 පෙබරවාරි මස 13 වැනි දින පූ. භා. 10.30 ට හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 පෙබරවාරි මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
හතරලියද්ද.

2012 නොවැම්බර් මස 29 වැනි දින,
හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 – 619

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: අඹකෝ/3/1/අ/142.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ
යොමු අංකය: එල්ඩී/05/2009/ඩබ්එස්/126.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගමුව කෝරලේ සුළු කොට්ඨාසයේ, බ්‍රවුන්ස්වික් වත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2012.09.28 දින අංක නු 2815 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 හා 2 වශයෙන් දැක්වෙන 'බ්‍රවුන්ස්වික් වත්ත' නමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.1033 ක් පමණ වන ඉඩම් කැබලි දෙක:

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: බ්‍රවුන්ස්වික් වත්ත; හිමිකම් කියන අය: මස්කෙළිය වැවිලි සමාගම, අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම; ප්‍රමාණය: හෙක්. 0.0453.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: බ්‍රවුන්ස්වික් වත්ත; හිමිකම් කියන අය: මස්කෙළිය වැවිලි සමාගම, අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම; ප්‍රමාණය: හෙක්. 0.0580.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මාර්තු මස 15 වැනි දින පෙ.ව. 10.30 ට අඹගමුව කෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 මාර්තු මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

එච්. එම්. සී. කේ. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය,
ගිනිගත්හේන.

2012 දෙසැම්බර් මස 04 වැනි දින,
අඹගමුව කෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 – 646

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.